# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 සැප්තැම්බර් මස 04 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.37 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවර්ධන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කිත්සිරි මංචනායක
කුරුසාමි කලන්කාඩි තේවර්
කොලන්නගේ වජිර පෙරේරා
ගුණසිරි ජයනාත්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක කුරුප්පු
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රවීන්ද්‍ර යසස් කුමානායක
රවි විජේසේකර
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් පිලිෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
කීර්ති කාරියවසම්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්ද්‍රසෝම සරණලාල්
ජගත් පී. විතාන
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මංජුල බුද්ධදාස
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රොජර් සෙනෙවිරත්න
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලයනල් ජයසිංහ
ලලිත් එල්ලාවල
විජිත් ප්‍රියන්ත
සුසාර දිනාල්
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා

## 01. **සභාපතිවරයාගේ නිවේදන :**

*i*

*"ගරු පළාත් සභා මන්ත්‍රී මොරිස් විජේරත්න මැතිතුමාව හා ගරු පළාත් සභා මන්ත්‍රී ලක්ෂ්මන් ගුණවර්ධන මැතිතුමාව 2018.09.03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මහජන පෙත්සම් කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් නම් කරන ලද බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. **නොපැමිණ සිටීමේ අවසරය :**

*"විජිත් ප්‍රියන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට හා ඉන්දික මහීෂ බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

## 03. **කාරක සභා වාර්තා :**

ගරු සභාපතිතුමා විසින් 2018.08.21 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව පිළිගන්වන ලදී.

## 04. **ධීවර සහ ජලජ සම්පත් ප්‍රඥප්තිය : පළමුවන වර කියැවීම**

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා [ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන්] විසින් *"2018 අංක .... දරන බස්නාහිර පළාතේ ධීවර සහ ජලජ සම්පත් ප්‍රඥප්තිය" පළමුවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලදී.*

***අනතුරුව හේමන්ත සමරකෝන් මහතා [සභා ලේකම්] විසින්,***

***එහි පූර්විකාව වූ,***

*"බස්නාහිර පළාතේ සමුද්‍ර ජල තීරයේ මෙන්ම අභ්‍යන්තර ජලාශවල ධීවර කර්මාන්තය විධිමත්ව කළමනාකරණය කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ ධීවර ප්‍රජාවගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ පාරිභෝගික ජනතාව වෙත සාධාරණ මිලකට මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ද,*

*එකී කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට පළාත් ධීවර අධ්‍යක්ෂ ධූරයක් ස්ථාපනය සඳහා ද, පළාත තුළ ධීවර කටයුතු පවත්වාගෙන යාම සඳහා උපදේශක සභාවක් පත්කිරීම සඳහා සහ ඒ සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි." යනුවෙන් ප්‍රකාශ කරන ලදී.*

***අනතුරුව, ප්‍රඥප්ති කෙටුම්පත ගරු සභාපතිතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 05. **කෘෂි සේවා අධිකාරී සංශෝධන ප්‍රඥප්තිය : පළමුවර කියැවීම**

*ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා [ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන්] විසින් "2018 අංක .... දරන බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරී ප්‍රඥප්තිය" පළමුවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලදී.*

***අනතුරුව හේමන්ත සමරකෝන් මහතා [සභා ලේකම්] විසින්,***

***එහි පූර්විකාව වූ,***

*"2012 අංක 01 දරන බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරී ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි." යනුවෙන් ප්‍රකාශ කරන ලදී.*

***අනතුරුව, ප්‍රඥප්ති කෙටුම්පත ගරු සභාපතිතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 06. **පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන කරන ලද පහත සඳහන් යෝජනාව ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"වර්තමාන ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස වූ පනත් කෙටුම්පත මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ, ඊට සම්බන්ධ හෝ එහි පසුවිපාකයක් ලෙස, පීඩාවට පත් තැනැත්තෙකු සඳහා යම් මූල්‍යමය ගෙවීමක් හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ දීම, ස්මාරක සැදීම හා මියගිය තැනැත්තෙකුගේ අනුස්මරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන සලසන තත්ත්වයක් තුළ මුළුමනින්ම කුරිරු ත්‍රස්තවාදීන්ට වන්දි ගෙවීමේ පසුබිමක් සැකසෙන බැවින් ඒ පිළිබඳව බලවත් අප්‍රසාදය රජයට පළ කරන අතරම, ඊට පනත් කෙටුම්පතේ අදාළ වගන්ති වන 27(ආ) (1), (අ) ඉවත් කර ඒ වෙනුවට බ්ලූමැන්ඩල්, මීතොටමුල්ල කුණු කඳු කඩා වැටීමෙන්ද, සාලාව අවි ගබඩාව පුපුරා යාමෙන්ද, ගංවතුර ගැලීම් ආදී ව්‍යසනයන්ට ලක් වූ ජනතාවට හා දේපළවලට වන්දි ගෙවීමට හැකි වන ආකාරයේ නෛතික ප්‍රතිපාදන මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජයෙන් ඉල්ලා සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා.10.51 ට සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින්,***

***පූ.භා. 11.04 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.27 ට යළිත් රැස්විය.***

***පූ.භා.11.37 ට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුව, ගණපූරණය ඇති විය.***

***අ.භා. 12.01 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීමේ යෝජනාව :

සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"දැන් මෙම සභාව කල් තැබිය යුතු ය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

### සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න :

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින්, සභාව කල් තබන අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය** :

අ. බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිල්ලේ සභා ශාලාවට සභාපතිතුමාගේ පිවිසුම සිදු වන දොරටුවේ ප්‍රධාන ද්වාරය සඳහා වැය වූ සම්පූර්ණ මුදල කීයද?

ආ. එම ද්වාරය වෙනුවෙන් වෙනම ඇස්තමේන්තුවක් තිබේද? එහි මුදල කීයද?

ඇ. එම ද්වාරය සකස් කිරීමට ලබා දුන්නේ ටෙන්ඩර් පටිපාටියකට අනුවද?

ඇ. ඒ අනුව ද්වාරය සකස් කිරීමට ඉල්ලුම් කළ ආයතන කවරේද? කුමන මිල ගණන් ඉදිරිපත් කළේද?

ඉ. ද්වාරය තැනූ ආයතනය කුමක්ද?

*ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පිළිතුරු සැපයීමට සති 02 ක කාලයකට කල් ගන්නා ලදී.*

***අනතුරුව, පළාත් සභාව අ.භා. 01.03 ට, 2018 සැප්තැම්බර් මස 18 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.09.03
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.